# පාලි සාහිත්‍යයේ එන මහාකාව්‍යයක් ජිනවංසදීපය හැඳින්විය හැකිද?

ආචාර්ය දුනේෂ් ඉන්ද්‍රරත්න ගුණතිලක[1]

පාලි සාහිත්‍යයේ සම්භාව්‍ය පද්‍ය ග්‍රන්ථ සේ සැලකෙන ජිනචරිතය, ජිනාලංකාරය, සමන්තකූටවණ්ණනාව ආදි කෘති රාශියක් ඇතත් ඒ අතරෙහි මහාකාව්‍ය ප්‍රවර්ගයෙහි ලා සැලකිය හැකි කෘතියක් දක්නට නොලැබේ. සංස්කෘත, ප්‍රාකෘත හා සිංහල ආදි සාහිත්‍යයන්හි මහාකාව්‍යය සම්භාවනාවට පත් වූ අතර ඒ භාෂාවන්ගෙන් ලියැවුණු අවිනෂ්ට මහාකාව්‍ය ග්‍රන්ථ ද හමු වේ.

පාලියෙන් රචිත ප්‍රධාන හා එක ම කාව්‍ය විචාර ග්‍රන්ථය වන සුබෝධාලංකාරයෙහි මහාකාව්‍ය ලක්ෂණ අන්තර්ගත නොවීම හා ඇතැම් මහාකාව්‍ය ලක්ෂණ ථේරවාදී සම්ප්‍රදායට ගෝචර නොවීම පාලි මහාකාව්‍යයක් බිහි නොවීමට හේතු වූවා විය හැකිය. එහෙත් පාලි පද්‍ය සාහිත්‍යයේ විකාශයත් සමග ඇති වූ සංස්කෘත ආභාසය නිසා පාලියෙහි මහාකාව්‍ය ග්‍රන්ථ නිර්මාණය වූයේ යැයි නිගමනය කිරීමට සාධක දැක්විය හැකිය. එය විසි වන සියවසේ මුල් භාගයේ ආරබ්ධ නව ප්‍රවණතාවක් සේ සැලකීම යුක්ති යුක්ත වේ. විසි වන සියවසෙහි රචිත පාලි පද්‍ය ග්‍රන්ථ අතරින් ජිනවංසදීපය, මහාකස්සපචරිතය, සාරිපුත්තචරිතය, ගාමණීචරිතය ආදි කෘති ප්‍රධාන තැනක් ගනියි. මොරටුවේ මේධානන්ද නාහිමියන් විසින් සංස්කෘත කාව්‍ය විචාර සිද්ධාන්ත අනුග මනය කරමින් ලියා ඇති ජිනවසංදීපය මේ අතරින් පාලියෙන් රචිත මහාකාව්‍යයක් ලෙස හැඳින්විය හැකිය. එය සර්ග තිහකින් හා ගාථා 2000කින් සමන්විත ය.

මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වූයේ ජිනවංසදීප කතුවරයා දණ්ඩින්ගේ මහාකාව්‍ය විග්‍රහය ඉතා සමීපව ඇසුරු කරමින් උදාර නායකත්ව ලක්ෂණවලින් සමුපේත වූ බුදුන් වහන්සේගේ චරිතය වස්තු විෂය කරගනිමින් එතෙක් පාලියෙහි මහාකාව්‍ය ග්‍රන්ථ නොතිබීමේ ඌනතාව පූරණය කිරීමට ගත් ප්‍රයත්නය විමසා බැලීමත් ජිනවංසදීපය විචාර සිද්ධාන්තානුකූලව මහාකාව්‍යයක් ලෙස සැලකිය හැකිදැයි විමසීමත් ය.

**ප්‍රමුඛ පද:** ජිනවංසදීපය, මහාකාව්‍ය, පාලි සාහිත්‍යය, අලංකාරවාදය, සංස්කෘත කාව්‍ය විචාර සිද්ධාන්ත

1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
Email: duneshsjp@gmail.com